මක්නිසාද කිසි අනාගත වාක්‍යයක් මනුෂ්‍ය කැමැත්තෙන් කිසි කලක නොපැමිණියේය. නමුත් මනුෂ්‍යයෝ ශුද්ධාත්මයාණන් විසින් පොළඹවනු ලැබ, දෙවියන්වහන්සේගෙන් ලැබූ ලෙස කථා කළෝය.



# බයිබලයේ දිව්‍යමය සම්භවය

- අද්විතීය පණිවිඩයක් සතු අද්විතීය පොත -

*(The Divine Origin of the Bible)*

- ෆ්‍රෙඩ් පියර්ස් විසිනි -

# බයිබලයේ දිව්‍යමය සම්භවය

- අද්විතීය පණිවිඩයක් සතු අද්විතීය පොත -

- ෆ්‍රෙඩ් පියර්ස් විසිනි -

# පටුන


| | |
|---|---|
| අද්විතීය පණිවිඩයක් සතු අද්විතීය පොත | 3 |
| ක්‍රිස්තියානි ආගම | 3 |
| බොහෝ පොත්, නමුත් එක් පොතක් | 4 |
| අනුභාවික වචනය | 5 |
| බයිබල් සත්‍යයේ දිවුරුම් ප්‍රකාශය | 6 |
| මිනිස් ස්වභාවය | 7 |
| ඊශ්‍රායෙලයේ සංසිද්ධිය | 9 |
| අභිකරු ජනතාවක් | 10 |
| ක්‍රි.පූ. 740 පමණ ඉශ්‍රායෙල්ට | 11 |
| වසර 130 කට පසුව යුදාහට | 11 |
| එවන් ලේඛන අතිවූයේ කෙසේද? | 12 |
| අද්විතීය අනාවැකිය | 13 |
| ඉතිහාසයේ ප්‍රගමනය | 14 |
| ශිෂ්ටාචාරයේ ප්‍රගමනය | 15 |
| මනුෂ්‍ය වර්ගයා දෙස බයිබලයේ දැක්ම | 17 |
| කූට ප්‍රාප්තිය | 18 |
| එක් ලෝක පාලකයෙක් | 18 |
| සදාකාලයටම රජ කෙනෙක් | 19 |
| සදාචාරාත්මක සාධකය | 20 |
| ලෝකය තුළ දෙවියන්වහන්සේ | 21 |
| "මෙම මනුෂ්‍යයා හට......" | 22 |
| අවසානය | 23 |
| ප්‍රශ්න | 25 |

# බයිබලයේ දිව්‍යමය සම්භවය

## - අද්විතීය පණිවිඩයක් සතු අද්විතීය පොත -

ඕනෑම ආගමක අධිකාරිය රඳා පවතින්නේ එහි සම්භවය මතය. සත්‍යය යනු කුමක්දැයි ප්‍රකාශ කරන්නේ කවුරුන්ද? සම්භවය හුදෙක් මානුෂික පමණක් නම්, අප සැලකිලිමත් වන්නේ මන්ද? කිසිම මිනිසෙකුගේ හෝ මිනිස් කණ්ඩායමකගේ හෝ අදහස් වෙනත් මිනිසුන්ගේ ඒවාට වැඩියෙන් අධිකාරියක් බල පවත්නේ නැත. ඒවා වඩා තර්කානුකූල සහ වඩා බුද්ධිගෝචර පදනමක ස්ථාපිතවූ බැව් පෙනුනත්, ඒවා තව දුරටත් මිනිස් මනසේ නිපැයුම්ය. පරම සත්‍යය ගැන සහතිකයක් ඒවා නොගෙනේ.

ලෝකයේ ප්‍රධාන ආගම් පදනම් වී ඇත්තේ මිනිසුන්ගේ ලියැවිලි මතය. බුද්ධ ධර්මය පදනම් වී ඇත්තේ ක්‍රි.පූ. 6 වැනි සියවසේ ඉන්දියාවේ ජිවත්වූ බුදුන්ගේ ඉගැන්වීම් මතය. සියවස් කිහිපයකට පසු උන්වහන්සේගේ භක්තිවන්තයෝ ඔහු දෙවියෙකු කලහ. හින්දු ධර්මය, ක්‍රි. පූ. 1500 දී පමණ පුරාණ වෛදික සම්භවය ලැබ, බ්‍රහ්මණාගම තුළින් විෂ්ණු සහ ශිව දෙවියන් වන්දනා කල පසු හින්දු ධර්මයට ක්‍රි. පූ. 2 වැනි සියවසේදී පරිනාමය විය. කොන්ෆියුසියානු ධර්මය, චීන සදාචාර දර්ශනයෙන් මතුවූයේ ක්‍රි.පූ. 5 වැනි සියවසේ කොන්ෆියුසියස් විසින් ක්‍රමවත්ව සකස් කිරීමෙනි. ක්‍රි. ව. 1 වැනි සියවසේදී කොන්ෆියුසියස් වන්දමානයේ වස්තුවක් විය. මෙම සෑම ආගමකම දෙවියන් වන්දනා කිරීම ආරම්භ වූයේ පළමු සිද්ධාන්ත ප්‍රසිද්ධියට පත්වූවායින් පසුවය. මුස්ලිම් ආගම වෙනත් ප්‍රභේදයකට අයත් වෙයි. ක්‍රි. ව. 8 වැනි සියවසේදී මහමත් විසින් ලියන ලද ලියැවිලි වලින් පැන නැගුනු එය, මහමත්ට සියවස් ගණනකට පෙර තිබූ ක්‍රිස්තියානි අදහස් සමඟ පැහැදිලි සම්බන්ධයක් පෙන්වයි.

දසලක්ෂ ගණන් භක්තිවන්තයන් සතු, පුළුල්ව ව්‍යාප්තවූ මෙම ආගම් පදනම් වී ඇත්තේ මිනිසුන්ගේ මුල් ප්‍රකාශ මතය. පසුව සිදුවූ සියලු දාර්ශනික විශෝධනයන්ට එරෙහිව, ඒවා උත්පාද වූයේ මිනිස් මනසේය.

## ක්‍රිස්තියානි ආගම

නමුත් ක්‍රිස්තියානිය ගැනත් එය සත්‍යයක් නොවේද? එහි ඉගැන්වීම් පිළිගනු ලබන්නේ, බයිබලය සැකසූ මුල් මිනිස් ලියවිලි පිළිගත් නිසා නොවේද?

පළමුවෙන්, මෙය තර්කානුකූල ප්‍රකාශයක් ලෙස පෙනෙයි. නමුත්, බයිබලය තුළ ඇති ලියැවිලි පරීක්‍ෂා කරන විට, ඉහත සඳහන් ආගම් වල පදනම් ලේඛන හා හාත්පසින් වෙනස් ප්‍රවර්ගයකට ඒවා අයත් බැව් අප සොයා ගන්නවා ඇත. ඇත්ත වශයෙන්ම ඒවා කොතරම් වෙනස්ද, කොතරම් අපූර්ව ගති ලක්‍ෂණ පෙන්වන්නේදයත්, ඒවා කාගේ වගකීමෙන්ද,යි යන ප්‍රශ්නය පැන නගෙයි. මිනිසුන් විද්‍යාමානව ලියූවත්, ඒවා සියල්ල පිටුපස සිතුවිලි කාගේද? බයිබලයේ ලියැවිලි වඩ වඩා අධ්‍යයනය කරන විට, මිනිස් මනසකට වඩා වෙනස් ශ්‍රේෂ්ඨ මනසක් ඒවා පිටුපස වූ බැව් කෙනෙකුට ප්‍රත්‍යක්‍ෂ වේ. 19 වැනි සියවසේදී එක්තරා ශිෂ්‍යයෙක්, එවන් පරීක්‍ෂණයකින් පසුව බයිබලය අරබයා පැමිණි බලවත් නිගමනය වූයේ, "මිනිසුන්ට හැකිවූවා නම් ලියන්නට කැමති නමුත් කැමති වූවා නම් නොලියන්නට හැකි" ලෙසය. (හෙන්රි රොජර්ස්, බයිබලයේ සුපිරිමානුෂික සම්භවය (1872)

බයිබලය දෙස අවධානාත්මකව බලා එහි විශේෂ ගති ලක්‍ෂණ නිරීක්‍ෂණය කරමු. බයිබලය ලෝකය තුළ අසමසම වන ලෙස ඒවා අසාමාන්‍ය බැව් අපට හමුවෙනු ඇත. සැබැවින්ම අපට නොසලකා හරින්නට නොහැකි පොතක්ය.

අපගේ සෝදිසියේදී පිළිපැදිය යුතු එක් වැදගත් ප්‍රතිපත්තියක් ඇත. තමන් සහ තම පණිවිඩය ගැන බයිබල් ලේඛකයන් පවසන්නේ කුමක්ද,යි අප නිරීක්‍ෂණය කලයුතු බව සහ පසුව ඔවුන් ගැන පැවසූ දේ කුමක්ද,යි පරීක්‍ෂාකාරී විමයි. මෙවන් දෙයක් අද මිනිසුන් පැවසීම ස්වභාවිකය. " අප ජීවත්වන්නේ බුද්ධිමත් යුගයකය, එම නිසා අපි වඩා හොඳින් දන්නෙමු." මෙම පොදු දෝශය පැන නගින්නේ මිනිස් විනිශ්චය මත පමණක් විශ්වාස රඳවා තැබීමෙනි. එම උපකල්පනය දැඩිව ප්‍රශ්න කිරීම සඳහා බොහෝ හේතු අපි සොයාගමු.

## බොහෝ පොත්, නමුත් එක් පොතක්

අප අතර බයිබලය පවතින්නේ එක් පොතක් වශයෙනි. නමුත් සැබැවින්ම එය විවිධ ලේඛකයින් 40 කට අධික ප්‍රමාණයක් ලියූ පොත් 60 කට වැඩි එකතුවක් වන අතර එහි සම්පාදනය මෝසෙස්ගේ දවස් වල සිට (ක්‍රි. පූ. 1400) අපෝස්තුලු පාවුල්ගේ (ක්‍රි.ව. 1 වැනි සියවස අවසානයේ) දවස් දක්වා වසර 1500 ක කාල පරාසයක් තුළ විහිදෙයි. එහි සිදුවීම් පෙළ මිනිසාගේ සම්භවය කරා ආපසු ගමන් කරයි. වර්තමාන දවස තෙක් ඉතිහාසය පුරා දිවෙන, මිනිස් වර්ගයා කෙරෙහි අභිලාෂයක් ඇති ස්වර්ගය සහ පෘථිවියේ දෙවියන්වහන්සේවූ සියල්ලේ මැවුම්කරු එය හඳුන්වා දෙයි. තව දුරටත්

ඉදිරියට ගොස් එම වර්ගයා හට අවසානයේදී සිදුවන දෙය පවසයි. මෙවන් විෂය පථයක පරාසයක් ඇති තවත් පොතක් ලෝකයේ නොමැත.

නමුත් එහි ලිවීම් හුදෙක් දාර්ශනික අනාවැකි නොවේ. සැබෑ ජාතීන් සහ සැබෑ මිනිසුන් අරබයා මිනිස් ඉතිහාසය තුළ ඒවා නිදානය වී ඇත. මිනිසාගේ පළමු ප්‍රගමනයත්, ජලගැල්මේදී ඔහු හට පැනවූ විනාශකාරී විනිශ්චයත් ගැන බයිබලය පවසන අතර එක්තරා ජනතාවක් වූ විශ්වාසවන්ත ආබ්‍රහම්ගේ පැවතෙන්නන්, ඔවුන්ගේ මිසර පීඩාවන්ගෙන් මුදවා ගැනීම සහ කානාන් දේශය ඔවුන්ගේ උරුමයසේ ලබා ගැනීම සමඟ දෙවියන්වහන්සේගේ අභිප්‍රායත් විස්තර කරයි. එම ජනතාවගේ ඉතිහාසයත්, ඔවුන්ගේ විශ්වාසවන්ත වූ මිනිසුන්ගේ ජීවිතත්, දෙවියන්වහන්සේගේ කැමැත්ත කිරීමේදී ඔවුන්ගේ අසාර්ථකත්වයත්, ඇසිරියානුන් සහ බැබිලෝනියානුන් තුළින් ඔවුන් මත පැමිණි විනිශ්චයන් සහ අවසානයේදී ඔවුන්ගේ රාජ්‍යය පෙරලා දැමීමත් එය විශ්වාසවන්තව වාර්තා කරයි. අලුත් ගිවිසුම තුළ, යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පැමිණීමත්, උන්වහන්සේගේ අපෝස්තුලුවරුන් විසින් සුභාරංචිය දේශනා කිරීමත් සඳහන් අතර ක්‍රි.ව. පළමුවැනි සියවසේ අදහන්නන් හට පළමු ප්‍රජාවන් සඳහා ඔවුන්ගේ ලිපි වලින් එය අවසන් වේ. නමුත් ඔවුන් කථා කල අනාවැකි වචනය කාලය තුළින් ආනාගතයට විහිදෙයි.

අපූර්ව කරුණ නම් වසර 1500 ක් දීර්ග වූ මෙම යුගය තුළ බයිබලය පවසන්නේ එක් අභිප්‍රායක් සතුවූ එක් දෙවිකෙනෙකු ගැනය. පැරණි ගිවිසුමේ පැරණිම පොත් සහ අලුත් ගිවිසුමේ මෑත පොත්, එකම ආකල්පය සහ එකම පරිඥානයකින් බැඳී තිබේ. එහෙයින් ඒවා සැබවින්ම එකම එළිදරව්වක් වෙයි. මිනිස් දුබලතාවයන්ගෙන් පිරි ලෝකයක් තුළ මෙය කෙසේ සිදුවුණේදැයි අප වටහා ගැනීමට යුතු කරුණකි.

## අනුභාවික වචනය

බයිබලයේ සෑම පොතකම ලේඛකයන් තුළ සොයාගත හැකි එක් පොදු සහතික වීමක් ඇත. එය නම් ඔවුන් ලේඛනගත කලේ තමන්ගේම වචන නොව, දෙවියන්වහන්සේගේ වචන සහ සිතුවිලි යන්නයි.

"ස්වාමින්වහන්සේ මෝසෙස්ට කථාකොට, මෙම වචන ලියාපන්න........" පසුව පැමිණි සියලුම ලේඛකයන්ගේ මුඛ්‍ය තේමාව වූයේ මෙයයි. ඉශ්‍රායලයේ සියලුම අනාගත වක්තෘෘන් ප්‍රකාශ කරන්නේ "දෙවියන්වහන්සේ මෙසේ පවසන සේක........" "දෙවියන්වහන්සේගේ වචනය මෙසේ පවසමින් මා කරා පැමිණියේ....." යනුවෙනි. ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ (ක්‍රි. ව. 1 වැනි

සියවසේදී ජෝසෆස් විසින් දෙන ලද විස්තරය අනුව, අප දන්නා ලෙස, උන්වහන්සේගේ "පැරණි ගිවිසුම" අපගේ "පැරණි ගිවිසුම" ම විය.) "ව්‍යවස්ථාව සහ දිවැස්වරුන්ගේ" අධිකාරිය පිළිගත්හ. උන්වහන්සේගේ අපෝස්තුලුවරු පසුව කලාසේ, උන්වහන්සේ තම දේශනා වල ඒවා නිතරම යොදා ගත්හ. එම නිසා බයිබලයේ ලියැවිලි දෙවියන්වහන්සේගේ කැමැත්ත පරිදි මිස, මනුෂ්‍යයාගේ කැමැත්තෙන් නොනිපදවනු ලැබූ, දෙවියන්වහන්සේගේ ආනුග්‍රාහික වචනය වේය යන ප්‍රත්පත්තිය පැනනැගි ඇත. (2 පේතෘස් 1:21) සියලුම ශුද්ධ ලියැවිලි "දේවානුභාවයෙන්" බැව් අපෝස්තුලු පාවුල් ලිවිය. (2 තිමෝති 3:16) ඒවායේ ඇති දෙවියන්වහන්සේගේ හුස්ම උන්වහන්සේගේම සිතුවිලි සහ උන්වහන්සේගේ මනස වේ.

## <u>බයිබල් සත්‍යයේ දිවුරුම් ප්‍රකාශය</u>

පළමු සභාවේ පළමු වසර 300 තුළ එකමතික දෘෂ්ටිය වූයේ පැරණි සහ අලුත් ගිවිසුම් දෙවියන්වහන්සේගේ වචනයවූ බැවිය. ජෝන් අර්ක්හාට් (ශුද්ධ ලියැවිල්ලේ අනුග්‍රාහිකත්වය සහ නිවැරදිතාවය 1895) මෙම කරුණ පැහැදිලි කිරීමේ ආකර්ෂණීය ක්‍රමයක් උපයෝගි කරගත්තේය. පළමු සභාවේ වැදගත් මිනිසුන්ගේ ලියැවිලි වලින් සාක්ෂි උපුටා දැක්වූ හෙතෙම 3 සියවසේ සිට පසුපසට ක්‍රමානුකූල ක්‍රියාකරමින් අපෝස්තුලු පාවුල්ගේ දවස් දක්වාම ගමන් කලේය. එසේ ඔහු, ඔරිගන් (3 වැනි සියවස) කර්තේජයේ බිෂොප්වූ සිප්රියන් ( 3 වැනි සියවස), අලෙක්සැන්ඩ්‍රියාවේ ක්ලෙමන්ට් (2 වැනි සයවසේ අවසන) ටර්ටුලියන් (2 වැනි සහ 3 වැනි සියවස්) ලියොන්හි බිෂොප් ඉරේනියස්, අන්තියෝකයේ බිෂොප් තියෝෆිලස්, ජස්ටින් මාටර් (සියල්ලෝම 2 වැනි සියවසේ), ඉන් පසු 2 වැනි සියවසේදී ධර්මය නිසා ඝාතනය කරන ලද අන්තියෝකයේ බිෂොප් ඉග්නේෂස් සහ පොලිකර්ප් සහ අවසානයේ ක්‍රි.ව. 91 දී රෝමයේ බිෂොප්වූ ක්ලෙමන්ට් තුළින් ආරම්භ කලේය. අර්ක්හාට් තම සමාලෝචනය මෙම ප්‍රකාශයෙන් අවසන් කලේය.

**"මෙම සාක්ෂි සියල්ලෙහිම අර්ථය පැහැදිලිය. එහි කිසිදු ගැටුමක් නැත. ශුද්ධ ලියවිල්ලේ - පැරණි සහ අලුත් ගිවිසුම් තුළ- ඇත්තේ එක දෘෂ්ටියකි. <u>ඒවා සමානව දෙවියන්වහන්සේගේ වචනය .......</u> අපගේ විමර්ශනයේදී එක් පරම වැදගත් දෙයක් ඇත. <u>මෙම දෘෂ්ටිය ගොඩනැගුනක් නොවේ.</u> එය ක්‍රිස්තියානි පරිනාමයේ නිපැයුමක් නොවේ. අපෝස්තුලුවරුන්ගේ කාලයේ සිටම එය පවරාදී ඇත. ශුද්ධ ලියවිල්ල ගැන අපෝස්තුලුවරු ඉගැන්වූ අනෙකුත් විද්‍යාමාන සාක්ෂි නොවමැතිව, ඔවුන් පැරණි**

**සහ අලුත් ගිවිසුම් දෙවියන්වහන්සේගේම වචනයේ කල්පනා කල බැව් යන නිගමනයෙන් පලා යෑමට හැකිමගක් මට නොපෙනේ. තම ගුරුවරුන් එසේම අවධාරනය සහ ඒකමතිකව වූවා නොවන්න අපෝස්තුලු වරුන්ගේ මෙම ගෝලයෝ කිසි දිනක මෙසේ අවධාරනයෙන් සහ ඒකමතිකව කථා නොකරනු ඇත."**

තමුත් තවත් එක් ප්‍රකාශයක් කිරීමට ඇත. මෙම ශුද්ධ ලියවිලි වල විද්‍යාමාන ලේඛකයන් - ව්‍යවස්ථාව, ගීතාවලිය සහ දිවැස්වරු, සුභාරංචි සහ ලිපි සහ එළිදරව්ව - තමන්ගේම වචන නොව දෙවියන්වහන්සේගේම වචන ලේඛනගත කල බවට සහතික වී තිබුනි. සැබැවින්ම ඔවුන් එසේ පවසත්. මෝසෙස්ගේ සිට අපෝස්තුලු පාවුල් දක්වා, වසර1500 ක් එක ලේඛන පද්ධතියක් තුළ මෙය තබත්තු කළ අතර ලෝකයේ කිසිම ස්ථානයක ලේඛන පද්ධතියක් තුළ එවැන්නක් සොයාගත නොහැක.

තමුත් ඔවුන්ගේම වදන් වල මෙම දෘෂ්ඨිය සුවිශේෂය. මිනිසුන් තමන්ගේ වදන්, විශේෂයෙන් තමන්ගේ අදහස් වල අධිකාරිය කැමැත්තෙන්ම අන් කෙනෙකුට ආරෝපණය කරන්නේ නැත. තමන් ලියන ලද දේ තුළ ඇති ගෞරවය තමන්ටම ඔවුන් ප්‍රකාශ කරගනු ඇත. එසේ නම් මෙම අසමසම ආකල්පය බයිබල් ලේඛකයන් අතර නොවෙනස්ව ආරක්‍ෂා වී පැමිණියේ කෙසේද? ඇත්තේ එකම බුද්ධිගෝචර පැහැදිලි කිරීමකි. ලේඛනගත කල සහ ඉගැන්වූ දේ මෙහෙයවමින්, මෙය පිටුපස එක් මනසක් විය. මෙතරම් සියවස් ගණනාවක් පුරා තම නිර්මාණ කෙරෙහි මෙවන් අස්වාභාවික දෘෂ්ඨියක්, මිනිසුන් හට තමන් විසින්ම පවත්වාගත නොහැක.

## මිනිස් ස්වභාවය

ආරම්භයේ සිට අවසානය දක්වා මිනිස් ස්වභාවය ගැන එකම දෘෂ්ඨියක් බයිබලය පවත්වාගෙන යයි. වසර ගණනක කාලසීමාවක් තුළ මිය යාමට නිශ්චය කර ඇති ජිවියෙක්වූ මනුෂ්‍යයා මැරෙන සුලු පමණක් නොවේ, ඔහු සදාචාරාත්මකවද දුබලයෙක්ව සිටී. නැතවත් බවේ සහ කල්පනාවේ, සචේතනිකභාවයේ සහ කැමැත්තේ විශිෂ්ඨ බලයෙන් උරුමකරගත් ඔහු තමා සතුටු කිරීමේ ආශාවේ පීඩනයටද යටත්ය. ඔහු සැමවිටම අසංවර වීමට, ලෝභ වීමට, සහ සියල්ලට ඉහලින් තමාගේ උඩඟුභාවය ආරක්‍ෂා කර ගැනීමේ පීඩනයට යටත්ව සිටී. තමා කළ යුත්තේ කුමක්දැයි දැන, නිතරම එය කිරීමට අසමත් වෙයි. බයිබලයේ වදන් වලින් මිනිසුන් දෙවියන් වහන්සේගේ කැමැත්ත දැනගත් විටත්, ඒ වෙනුවට තමාගේ කැමැත්ත කිරීමට පොදුවේ මනාපයක් දක්වයි.

බයිබලයේ සාක්ෂිය ආවධාරානාත්මක සහ ඒකමතිකය. ඔවුන්ගේ "රැවටිල්ල සහ ප්‍රචණ්ඩත්වය" නිසා ජල ගැල්මට පෙර පරම්පරාවට විනිශ්චය පනවමින් දෙවියන්වහන්සේ මෙසේ ප්‍රකාශ කරයි. " ඔහුගේ සිතේ කල්පනාවල කවර අරමුණක් නිරන්තරයෙන් නපුරුවට තිබේ." (උත්පත්ති 6:5) වෙනත් වචන වලින්, ඔහු උපත ලබන්නේ ඒ ප්‍රවණතාවය සමඟය. ක්‍රිස්තුස්වහන්සේට වසර 600 කට පෙර ලියමින්, දිව්‍යස්වර යෙරමියා පැවසුයේ, "සියල්ලට වඩා සිත රැවටිලිකාරව තිබේ. එය දුෂ්ඨවම තිබේ." (17:19) එහි ප්‍රතිපලයක් ලෙස ඔහු මෙසේ ප්‍රකාශ කරයි. "මනුෂ්‍යයාගේ මාර්ගය ඔහුට අයිති නැති බව දනිමි. ගමනෙහි යෙදෙන මනුෂ්‍යයාට තමාගේ ගමන නියම කිරීම අයිති නැත." (10:23) වෙනත් වචන වලින්, තමාට යහපත්ම දේ මනුෂ්‍යයා දන්නේ නැත. ඔහුට දෙවියන්වහන්සේගේ මගපෙන්වීම අවශ්‍යය.

මාර්ක්ගේ සුභාරංචියේ වාර්තා කර ඇති යේසුස්වහන්සේගේ ප්‍රකාශය මුලු බයිබලයේම ඇති ඉතා සෘජු ප්‍රකාශයකි. ආහාරයට පෙර චාරිත්‍රානුකූලව තම දැත් නොසේදූ සහ නොසේදූ භාජන වලින් (චාරිත්‍රානුකූලව පිරිසිදු නොකරන ලද) ආහාර ගත් තම ගෝලයන් හට තරවටු කරමින් සිටි යුදෙව් නායකයන් හටු මුහුණ දුන් යේසුස්වහන්සේ, සැබෑ කෙලෙසීම නම් "හදවතට (මනසට) ඇතුළු වන දේ" යැයි ඔවුනට පවසන සේක. ඉන්පසු උන්වහන්සේ මෙම අති ප්‍රබල විනිශ්චය ඉදිරිපත් කරයි.

> **"මනුෂ්‍යයා අපවිත්‍රවන්නේ ඔහු තුළින් නික්මෙන දේවලින්ය... මනුෂ්‍යයා අපවිත්‍රවන්නේ ඔහුගෙන් පිටවන දෙයින්මය. මක්නිසාද ඇතුලතින් එනම් මනුෂ්‍යයාගේ සිතින් නපුරු සිතුවිලි, වේශ්‍යකම්, සොරකම්, මිනීමැරීම්, කාමමිත්‍යාචාරකම්, තන්හා, දුෂ්ඨකම්, වංචාව, සල්ලාලකම, ඊර්ෂ්‍යාව, අපහාස කිරීම, උඩඟුකම, සහ මෝඩකම නික්මෙයි. මේ සියලු නපුරු දේ ඇතුලතින් නික්මී මනුෂ්‍යයා අපවිත්‍ර කෙරේ." (මාර්ක් 7:16-23)**

මිනිසාගේ මෙම ස්වභාවික නැඹුරුතාවයන්හි එළිදරව් තුළ අප සැම සඳහා සත්‍යයේ අසහනකාරි නාදය ඇත. එය ලෝකයේ කොතැනකවත්, කිසිම විෂයයක ලේඛනයක හෝ පෝෂණය වන්නාවූ ඉගැන්වීමක හමු නොවේ. එය අසමසමය. අප මතම විනිශ්චයක් ලෙස එය අප්‍රිය ජනක සහ නොපිළිගත හැකිය. නමුත් මෝසෙස්ගේ සිට අපෝස්තුලු යොහන් දක්වා වසර 1500 ක් තිස්සේ බයිබලය එය නිරතුරුවම පවත්වාගෙන යයි. මෙය සිදුවූයේ කෙසේද? තමන්ටම ඉඩදුන්නේ නම්, මිනිස් ලේඛකයෝ කිසි දිනෙක මෙය නොනිපදවනු ඇත. එය පිටුපස මනසක් තිබිය යුතුවිය. දෙවියන්වහන්සේගේම මනසය.

# ඊශ්‍රායෙලයේ සංසිද්ධිය

ඉශ්‍රායෙල් ජාතියේ ප්‍රගමනය, වෙනත් කිසිම ජාතියක හමු නොවන්නොවූ අස්වාභාවික ලක්ෂණ පෙන්වයි. එකම මිනිසෙකුට, ක්‍රි. පූ 1800 දී පමණ ජීවත්වූ හෙබ්‍රෙව්වරයෙකු වූ ආබ්‍රහම් වෙත තම සම්භවය සලකුණු කරගත් එකම ජාතිය ඔවුන් වන අතර ක්‍රි. පූ. 400 දක්වා වසර 1400 ක පරාසයක් මැදපෙරදිග ජනතාවක් ලෙස තම පුද්ගලයන් සහ ස්ථාන, ජයග්‍රහණ සහ විනාශයන්ගේ සවිස්තරාත්මක ලිඛිත වාර්තා ඉදිරිපත් කල හැකි ජාතිය වන්නේය. මෙම අපූර්ව ඉතිහාසයේ සුවිශේෂිදෑ කිහිපයක් අපි පරීක්ෂාකර බලමු.

පළමුවෙන්ම ක්‍රි. පූ. 1400 දී පමණ කනාන් දේශයේ (දැන් ඊශ්‍රායෙලය) ජාතියක් වශයෙන් ඔවුන් මතුවීමේ අභිරහස ඇත. සැලකිය යුතු බලයක් සමගින් සමූහයක් ලෙස ඔවුහු මිසරය අත්හැර දැමූහ. දැන් මෝසෙස්ගේ ව්‍යවස්ථාව යනුවෙන් හැඳින්වූ, එකම නීතිපද්ධතියකට ඒකමතිකව යටත්ව, එක් දෙවිකෙනෙක් පිළිගැනීමෙන් ඒකත්වයට පත් ගෝත්‍ර දොලොසම හමුවේ. ඔවුන්ගේ ජීවිතයේ සෑම පැතිකඩක්ම පාලනය කල එය දැඩි රජයනයක් විය. එ ය ඔවුන්ගේ ආගමික වන්දනා ජීවිතය තීන්දු කලේය. සතිපතා සබත (තවමත් පවත්වනු ලබයි.) පාස්කුව ඇතුලු ප්‍රධාන උත්සව තුන (තවමත් පවත්වනු ලබයි.) අනිවාර්යය පූජා ඇතුළුව පූජකයන් සහ මණ්ඩපය සහ ඔවුන්ගේ ජිවිත වල සියලු පැතිකඩවල තම තමන් අතර සම්බන්ධකම් පාලනය කරන විස්තරාත්මක නීතිද විය. ඔවුන්ගේ පෞද්ගලික යුතුකම්වල කෙටි සාමාලෝචනයක් ලෙස දස පනත ප්‍රසිද්ධවී ඇති නමුත්, පවිත්‍රකම සහ අපවිත්‍රකම, අනුභවයට සුදුසු සහ තහනම් ආහාර, ගෙවිය යුතු වන්දි සහ විනිශ්චයන් - මරණය ඇතුළුව - නිශ්චිත අවස්ථාවන්හිදී ක්‍රියාකල යුතු ආකාරය ගැන වෙනත් බොහෝ රීතිද තිබුනි. සියලු පිරිමින් චර්මච්ඡේදන චාරිත්‍රයට යටත් විය යුතුවිය. (තවමත් ක්‍රියාත්මක කෙරේ.)

මෙය "පහසු ව්‍යවස්ථාවක්" නොවිය. එය ඉතා පීඩාදායක විය. එය බැඳීම් පැනවිය, වස්තුවේ සහ පෞද්ගලික උවමනාකම් වලින් පූජා ඉල්ලිය, තම දෙවියන්වහන්සේට ගෞරවාන්විත වන්දනාවේ ආකල්පයක පිහිටා සිටීමක් අපේක්ෂා කලේය. එය අවධාරනයෙන්ම තමන්ගේ නිදහස් කැමැත්තෙන් තමන් සඳහාම කිසිම ජනතාවක් තෝරාගන්නා ව්‍යවස්ථාවක් නොවිය. එය බොහෝ ආක්‍රාන්තික සහ බොහෝ අපේක්ෂා සහගතය. එකම අවස්ථාවක, විශාල ජන සමූහයක් වැදගත් ආගමික, පෞද්ගලික සහ දේශපාලනික කරුණු මත එකම චිත්තයකට ගෙන ඒම ඉතා දුෂ්කරය. එසේ නම්, තමන් සඳහා මෙම ව්‍යවස්ථාව සම්පූර්ණ ඉශ්‍රායෙල් ගෝත්‍ර දොලොස ඒකමතිකව පිළිගත්තේ කෙසේද?

ජනතාවගේ ඉතිහාසයේ මෙම විශේෂ සන්ධිස්ථානයේදී සිදු වූ අනපේක්ෂිත ඉසව් මාලාවක් තුළ පිළිතුර හමුවේ. තමන් වෙනුවෙන් සිදු කෙරුනු දිව්‍යමය ශක්තියේ ප්‍රාතිහාර්යාත්මක ප්‍රදර්ශනයන් තුළින්, මිසර දේශයේ වහල් කමින් ඉශ්‍රායෙල් පිටතට රැගෙන ආ ආකාරය බයිබලය අපට පවසයි. මිසරයේ රජවූ පාරාවෝ ඔවුනට පිටවීමට කැමැත්ත නොදුන් අතර තම ජාතිය මත පතිතවූ පීඩාවල් දසය අතර ඔහුගේ හිතුවක්කාරී විරෝධයේ එල්බ සිටියේය. එය අවසන් වූයේ ඔහුගේ හමුදාව රතු මුහුදේදී විනාශ වීමෙනි. මෙම ඉසව් මගින් ඉශ්‍රායෙල්හි දෙවියන්වහන්සේ මිසරයේ සංකීර්ණ මිත්‍යා දෘෂ්ටික ක්‍රමය මත විනිශ්චයන් ක්‍රියාවට නංවා තමන්වහන්සේ පමණක් දෙවියන් වහන්සේ බැව් - "වෙන කිසිවෙකුත් නැත" - ප්‍රදර්ශනය කර, ඔවුන් තම ජනතාව බැව්වූ පොරොන්දුව ඉශ්‍රායෙල්ට සහතික කලසේක. නික්මයාම පොත පවසන පරිදි, මෙම මහත් ඉසව් සැබැවින්ම සිදුවූයේ නම්, පළමුවෙන් කාන්තාරයේදීත් ඉන්පසුව කනාන් දේශයේදීත් ඉශ්‍රායෙලය මෙම ව්‍යවස්ථාව ඒකමතිකව පිළිගැනීම කෙසේ වූයේදැයි හොඳින් දැන ගැනීමට අපට හැකි අතර අදටත් ඔවුන් අතර භක්තිමත් අය එසේ කරන්නේ ඇයිද යන්නද දැනගත හැක. නමුත් මෙම දිව්‍යමය ශක්තියේ ප්‍රදර්ශනය නොමැතිව, මෝසෙස්ගේ ව්‍යවස්ථාව ඒකමතිකව පිළිගෙන ඔවුන් ජාතියක් ලෙස පැවතීම විග්‍රහ කිරීම බොහෝ අපහසුය.

## අද්භූත ජනතාවක්

තම පැවැත්මේ පළමු වසර 1400 යේ සම්පූර්ණ වාර්තා රක්ෂිත කිරීම අරබයා ඉශ්‍රායෙල් ජාතිය අසමසමය. පැරණි ගිවිසුමේ ඓතිහාසික පොත තුළ විස්තරාත්මක සහ නිශ්චිත වාර්තා, නම්, ඉසව් සහ දින, මැදපෙරදිග අනෙකුත් ජාතින් සම්බන්ධ වැදගත් දේශපාලනික තත්ත්වයෙන් ඉදිරිපත් වේ. ක්‍රි.පූ. 1800-400 දක්වා යුගයේ සිදුවීම් ගැන අනෙකුත් මූලාශ්‍රවලින් දැනගත් දේ සමඟ මේවා කදීමට එකඟ වේ. මෙයට අසලින් හෝ ලඟාවෙන වාර්තාවක් පෘථිවිය මත වෙනත් ජාතියක් සතු නොවේ.

අපූර්ව දෙය නම්, මෙම ඓතිහාසික වාර්තා - උදාහරණයක් ලෙස විනිශ්චයකාරයන්, සාමුවෙල්, රාජාවලිය, ලේකම් පොත්, එස්රා සහ නෙහෙමියා- ඉතිහාසඥයන්ගේ සාමාන්‍ය ක්‍රියාවෙන් ඔබ්බට ගොස්, මුලු ජාතියටත් ඒ සම්බන්ධ චරිත වලටත් සදාචාරාත්මක විනිශ්චයන් ඒකමතිකව ප්‍රකාශ කිරීමයි. ඔවුන් වාර්තා කරන්නේ යම්කිසි රජ කෙනෙකු යම්කිසි වසර ගණනාවක් රාජ්‍ය කල බැව් පමණක් නොවේ. නමුත් "ඔහු දෙවියන්වහන්සේ ඉදිරියේ දුෂ්ඨව සිටියේය." හෝ අඩු වශයෙන් "ඔහු යහපත්ව තිබුදේ කලේය.........." යනුවෙනි.

මතුවෙන ජාතියේ ප්‍රතිරූපය නම්, තමන්ගේ දෙවියන්වහන්සේගේ සත්‍ය වන්දනාව නිතරම අත්හරින, නොවැලැක්විය හැකි දුරාචාරය සමගින් තම මිත්‍යාදෘෂ්ඨික අසල්වැසි ජාතීන්ගේ රූප වැඳීමේ ආභාෂයන් වැළඳගන්නාවූ ජනතාවක්ය. ව්‍යාතිරේකයක් නොමැතිව දිවැස්වරුන්ගේ ලියැවිලිවල අඩංගු වන්නේ තම දෙවියන්වහන්සේ හට කීකරු වීමට ඉශ්‍රායෙලයේ අසමත්කම් පිළිබඳ දීර්ඝ කොටස් සහ තම මාර්ග සාදා නොගන්නේ නම් ඔවුන් මත පැමිණෙන විනිශ්චයන්ගේ අනාවැකිය. ඔවුන් වටා සිටි ජාතාවන්ගේ අනුක්‍රමික ආක්‍රමණ තුළින් එම විනිශ්චයන් සම්පූර්ණ විය.

මෙම අවස්ථාව වන විට, සාවුල් , දාවිත් සහ සලමොන් විසින් පාලනය කරන ලද ජාතිය, ඉශ්‍රායෙල් නාමය දරා සිටි උතුරු රාජ්‍යය සහ යුදා නමින් හැඳින්වූ දකුණු රාජ්‍යයකට කණ්ඩනය විය. මේ සැමෙකක්ම දෙවියන් වහන්සෙගේ සත්‍ය වන්දනාව අතපසු කල අතර දෙවියන්වහන්සේ තම දිවැස්වරු තුළින් පළමුව තම දුෂ්ට මාවත් වලින් හැරී එන්නට ඔවුනට ආයාචනය කළ අතර ඉන්පසුව ඔවුන් එය සැලකිල්ලට නොගත් පසු ඔවුන් මත පතිත වන අනිවාර්ය විනිශ්චයන් ගැන අවවාද කලසේක. පහත ඇත්තේ දිවැස්වරුන්ගේ එවන් විනයයන් පිරි වදන් ආදර්ශයකි.

## ක්‍රි. පූ. 740 පමණ ඉශ්‍රායෙල්ට

"නමුත් ඔවුහු ඇහුම්කන් නොදී තමුන්ගේ දෙවිවූ ස්වාමීන් වහන්සේගේ සියලු ආඥා අත්හැර, වාත්තු කල පිළිමවන වස්සන් දෙන්නෙක්ද, අශේරා කණුවක්ද සාදාගෙන, මුලු අහස් සේනාවට (හිරු, සඳු, තාරකා) නමස්කාර කරමින්, බාල්ට සේවය කලෝය. ඔවුහු තමුන්ගේ පුත්‍රයන්ද දූවරුන්ද ගින මැදින් යවා පූජා කලේය. පේන කීමද, ශාස්ත්‍ර බැලීමද භාවිතා කලෝය. ස්වාමීන්වහන්සේ උදහස් කරවන ලෙස උන්වහන්සේගේ ඇස් හමුයෙහි නපුරුව තිබුනු දේ කිරීමටද භාරවුනෝය. ඒ නිසා ස්වාමීන්වහන්සේ ඉශ්‍රායෙල්වරුන් කෙරෙහි ඉතා උදහස් වී තමන්ගේ ඇස් හමුයෙන් ඔවුන් පහ කල සේක...." (2 රාජාවලිය 17:13-18)

ඉතින්, ක්‍රි.පූ. 720 දී පමණ ඇසිරියානුන් දේශය ආක්‍රමණය කර සාමාරිය අල්ලා, උතුරු රාජ්‍යය පෙරලා දැමුවෝය.

## වසර 130 කට පසුව යුදා හට

"පූජකයන්ගේ සියලු ප්‍රධානීහුද සෙනඟද ජාතීන්ගේ සියලු පිළිකුල්වල හැටියට බොහෝ සේ අපරාධ කරමින්............ ඔවුන්ගේ පියවරුන්ගේ දෙවිවූ

ස්වාමින්වහන්සේ ස්වකීය සෙනඟටත්............ අනුකම්පා කල නිසා....... පණිවිඩකාරයන් (දිවැස්වරු) අත ඔවුනට කියා ඇරිය සේක......... නමුත් සුවයක් නැති තරම් ස්වාමින් වහන්සේගේ කෝපය තමන්ගේ සෙනඟට විරුද්ධව පැමිණෙන ලෙස ඔවුහු දෙවියන්වහන්සේගේ පණිවිඩකාරයන්ට සරදම්කර, උන්වහන්සේගේ වචන සුළුකර උන්වහන්සේගේ ප්‍රොපේතරුන්ට නින්දා කලෝය......" (2 ලේකම් 36:14-16)

ඉතින්, බැබිලෝනිවරු පැමිණි අවසානයේදී ක්‍රි. පූ. 590 දී පමණ යෙරුසලම් නුවර අල්ලා, එහි දේවමාලිගය ගිනිබත් කොට, ජනයාගේ මහත් වගකීම් ඇති අය සිරකරුවන්සේ රැගෙන ගියහ. රාජ්‍යයක් ලෙස ඉශ්‍රායෙල්ගේ පැවැත්ම අවසන් විය.

දැන් පිළිතුරක් ලැබිය යුතු ප්‍රශ්නය මෙයයි: ඔවුන්ගේ විශ්වාස විරහිතභාවය, ද්‍රෝහීභාවය සහ දූෂණය එතරම් සෘජුභාවයකින් එළිදැක්වූ වාර්තා, ඉශ්‍රායෙල් ආරක්‍ෂා කලේ කෙසේද? එවන් විස්තරාත්මක වාර්තා සතු වෙනත් ජාතියක් නොමැති වුවත්, එවන් එකක් පැවතුනද, ඔවුන් එවන් අපහාසාත්මක ලේඛන කසල ගොඩකට දමනවා මිස ජාතික වස්තූන් ලෙස ආරක්‍ෂා නොකරනු ඇත. ඉශ්‍රායෙලයේ ඓතිහාසික වාර්තා සත්‍ය නොවේ නම්, ඒවා යුදෙව් ජනතාවට එරෙහි දීර්ඝ අපහාසාත්මක ප්‍රකාශයක් බැව් හොඳින් නිරීක්‍ෂණය කර ඇත. එසේ නම් ඒවා අද දක්වා ඔවුන් ආරක්‍ෂා කලේ ඇයි?

## එවන් ලේඛන ඇතිවූයේ කෙසේද?

මෙයට සම්බන්ධ ප්‍රශ්නයද එසේම සුපරීක්‍ෂාකාරීය: අන් සියලු ජාතීන් මෙන්ම පොදු ගති ලක්‍ෂණ විද්‍යාමාන කරන ජනතාවක් - ජාතික අභිමානය, දූෂිත රජවරු, බලය සහ දේපොළ සඳහා අසංවර තණ්හාව, අන්‍යජාතීන්ගේ පිළිම වන්දනා පිළිගැනීමේ සූදානම සමඟ තම දෙවියන්වහන්සේගේ ප්‍රබුද්ධ ව්‍යවස්ථාවන් නොකඩවා ප්‍රතික්ෂේප කිරීම එවන් අයාලේ යන ජනතාවක්, ගීතාවලිය සහ දේශනාකාරයාගේ උත්කෘෂ්ඨ සදාචාරාත්මක ශික්ෂණ, ඒවායේ අවධාරනය සත්‍යය තුළ පෞද්ගලික හැසිරීම, දයාව, තමාගේ අසල්වැසියා ගැන සැලකිල්ල සහ සියල්ලට ඉහලින් ස්වර්ගයේ සහ පෘථිවියේ දෙවියන් වහන්සේ කෙරෙහි ගෞරවය කෙසේ නිපදවූයේද? වෙනත් කිසිම ජනතාවක් මෙසේ නොකලේය. සදාචාරාත්මකව දුබල ජනතාවක්වූ ඉශ්‍රායෙල් මෙය නිපද වූයේ කෙසේද?

මිනිස් පදනමක සිට මෙය විස්තර කල නොහැක. නමුත් වාර්ථාව සත්‍ය නම්, එය සැබැවින්ම මනුෂ්‍යයාගේ නොව දෙවියන්වහන්සේගේ අභිලාෂය

ප්‍රකාශ කරන්නේ නම්, සියල්ල වැටහේ. බයිබල් ලේඛන පිටුපස මිනිස් මනසට වඩා ශ්‍රේෂ්ඨ මනසක් තිබිය යුතුය. වෙනත් කිසිම ප්‍රතිපත්තියක් මත මෙවන් සියවස් ගණනාවක් තිස්සේ එම ඉගැන්වීමේ පොදු අරමුණ පවත්වාගෙන යා නොහැක. එය ඉවත නොදමා ඉශ්‍රායලය මෙම පොත සංරක්‍ෂණය කර ඇත්තේ ඒ නිසාය. එහි පණිවිඩය දෙවියන්වහන්සේගෙන් බැව් ඔවුන් දනී.

## අද්විතීය අනාවැකිය

සියලු මනුෂ්‍ය වර්ගයාගේ අත්දැකීම් තුළ අනාගතය ගැන නිසැක ඥාණයක් නොමැත. වසර සියයක් හෝ පැමිණෙන්නාවූ වසර තුළ හෝ නොව, හෙට කුමක් සිදුවන්නේ දැයි අප ප්‍රායෝගිකව නොදන්නෙමු. එසේ නමුත් බයිබලයේ ලේඛන අද්විතිය වන්නේ, විශාල කාල පරාසයක් ආවරණය කරන ජාත්‍යාන්තර සිද්ධීන් ගැන ඒවා නොබියව අනාවැකි පවසන නිසාවෙනි.

ඉශ්‍රායෙල් ජාතිය උත්කෘෂ්ට උදාහරණයක් සපයයි. පළමුව උතුරු සහ පසුව දක්‍ෂිණ රාජධානි ඇසිරියානුන් සහ බැබිලෝනියන්වරු විසින් වහල් කමට ගත් ආකාරය අපි දුටුවෙමු. පසුව බොහෝ අය නැවත පැමිණයද, නොබෝ කලෙකින් යුදෙව්වෝ තර්ජනයට යටත්වූ අතර, මෙවර ක්‍රි.ව. 1 වැනි සියවසේදී රෝමානුවන් විසින් තම භූමියෙන් පන්නා දමන ලදී. දිවැස්වරුන්ගේ පරම්පරාවේ අන්තිමයා යේසුස්වහන්සේ වූ අතර උන්වහන්සේ මෙසේ පැවසූ සේක. "ඔවුහු කඩු මුවහතින් වැටෙන්නෝය. සියලු ජාතීන් අතරට වහලුන් මෙන් ගෙන යනු ලබන්නේය........ යෙරුසලෙම අන්‍යජාතීන් විසින් මඩිනු ලබන්නීය." (ලූක් 21:24)

ඉතින්, එය ක්‍රි.ව. 70 දී ඉටුවූ අතර, එය කථාවේ අවසානය විය යුතුව තිබුනි. මානව මතයට නම්, එවන් විසුරුවන ලද, පීඩාවට පත් සහ පරිභව කරන ලද ජනතාවක් පෘථිවියෙන් නොපෙනී ගොස් බොහෝ කලකට පෙර අමතක කරන ලදුව තිබිය යුතුය. නමුත් දිවැස්වරු පැවසුවේ ඔවුන් අතුරුදහන් නොවන බවත් අවසානයේදී නැවත තම භූමිය ප්‍රකෘතිමත් කරන බවත්ය.

"මක්නිසාද මා විසින් මාගේ සෙනඟවූ ඉශ්‍රායෙල්වරුන්ගේත් යුදාවරුන්ගේත් වාහල්කම පහ කරන දවස් පැමිණෙන්නේ යැයි ස්වාමීන් වහන්සේ කියන සේක. මම ඔවුන්ගේ පියවරුන්ට දුන් දේශයට ඔවුන් නැවත ගෙනයන්නෙමි. ඔවුහුද ඒක භුක්තිවිඳින්නේය....... බලව මම උතුරු දේශයෙන් ඔවුන් ගෙනෙන්නෙමි. ඔවුන් පොළොවේ ඉතා දුර තැන් වලින්ද...... එම්බා ජාතිනි, ස්වාමීන්වහන්සේගේ වචන අසා........

ඉශ්‍රායෙල්වරුන් විසිරෙවූ තැනැන්වහන්සේ ඔවුන් රැස්කර......." (යෙරමියා 30:3, 31:8, 10)

එය ඉටුවී තිබේ. අපගේ 20 වැනි සියවසේ යුදෙව්වියෝ පලස්තිනයට නැවත පැමිණ ඇති අතර නැවත ඉශ්‍රායෙල් රාජ්‍යයක්, යෙරුසලෙම එහි අගනුවර ලෙස පිහිටුවා ඇත.

මෙම ඉදිරිය කා හට දැකිය හැකිවිද? මුලු පෘථිවිය පුරාම ඉශ්‍රායෙල් විසුරුවා හරින බවත්, වසර 2000 කට පමණ පසු නැවත පැමිණ පුරාණ රාජධානිය පිහිටුවන බවත් දැනගන්නට හැකිවූයේ කාහටද? කිසිම මිනිසෙකුට හෝ කණ්ඩායමකට හෝ මෙසේ සිදුවන බැව් සිතිය නොහැකි විය. නමුත් කවුරුන් හෝ එය දැන සිටියහ. ඒ දෙවියන්වහන්සේ පමණක් විය යුතුය. ලෝකයේ ජාතීන් මුලුමනින්ම බලාපොරොත්තු නොවූ ඉරණමක් අනාවැකිකිමට දිවැස්වරුන්ගේ ලේඛන වලට අනුප්‍රාණය දැක්වූයේ උන්වහන්සේය.

## ඉතිහාසයේ ප්‍රගමනය

දානියෙල්, ක්‍රි. පූ. 600 පමරණ බැබිලෝනියාවේ රජවාසල සිටි වැදගත් අයෙකි. නමුත් ඔහුගේ පොතේ අනාවැකි, ඔහුට සියවස් ගණනකට පසු, නැගෙන සහ ඇදවැටෙන අධිරාජ්‍යයන් පිළිබඳ දැනුමක් පෙන්වති.

පළනම් අනාවැකිය නම්, රජතුමා දුටු ස්වප්නයක අර්ථ විවරණයයි. එහිදී ඔහු දුටුයේ විවිධ ලෝහයන්ගෙන් නිර්මිත මහත් පිළිරුවක් සහ විශාල ගලක් මගින් එය විනාශ කර පොළොවට ඇද දැමීමයි. දානියෙල් පැවසුයේ (තම දැනීම ඔහු දෙවියන්වහන්සේ හට පවරන ලදී.) මෙම පිළිරුව මහා අධිරාජ්‍යයන් හතරක් නියෝජනය කරන බව සහ ඒවායේ ප්‍රතිපලයි. එහි පළමුවැන්න බැබිලෝනියම බැව් හෙතෙම හඳුනා ගනී. අනෙක් දෙක ඔහුගේ අනාවැකි පොතේ අනෙක් කොටස්වල පර්සියාව සහ ග්‍රීසිය යනුවෙන් පැහැදිලිව නම්කර ඇත. ශක්තිමත් සහ බියකරු සතරවැන්න, අවසානයේදී වෙන්වූ රාජධානිවලට කැඩීගිය රෝමානු අධිරාජ්‍යය පමණක් විය හැකිය.

ඉතින්, එය ඉටුවුනි. ප්‍රාථමිකව, බයිබලය සැලකිලිමත් වන්නේ මැදපෙරදිග සහ මධ්‍යදරණී මුහුද අවට ඇති භූමින් ගැනය. දානියෙල්ගේ දවස් වල, ක්‍රි.පූ. 600 දී, ශ්‍රේෂ්ඨතම අධිරාජ්‍යය වූයේ බැබිලෝනියයි. එයින් පසු ක්‍රි.පූ. 530 දී පමණ මෙදෝ සහ පර්සියානුන්ගේ අධිරාජ්‍යය පැමිණි අතර, එයද අනතුරුව ග්‍රීසියේ මහා අලෙක්සැන්ඩර් විසින් ක්‍රි.පූ. 330 දී පමණ පෙරලා දමන ලදී. හතර වැනි සහ ශ්‍රේෂ්ඨතමය වූයේ රෝමානු රාජ්‍යය පාලනය වන අතර එය වසර හයසියයේ සිට හත්සියයක් දක්වා ක්‍රි. පූ. 2 වැනි

සියවසේ සිට ක්‍රි.ව. 5 වැනි සියවස දක්වා පැවතුනි. එම රාජ්‍යය කෙතරම් වූයේද යත්, (ඉශ්‍රායෙලය ඇතුළුව) මැදපෙරදිග සියලු දේශයන්, මධ්‍යධරණී මුහුද වටා ඇති භූමි සහ යුරෝපයේ බොහෝ ප්‍රදේශ එයට අයත් වුනි. නමුත් මෙම බලවත් රෝම අධිරාජ්‍යය පස්වැන්නකින් අනුසරණය නොවන්නට තිබූ අතර, එය ඒකාබද්ධ නොවී වෙන්වූ ජාතීන්ගෙන් යුත් කොටස් වලට කැඩෙන්නට නියම වී තිබුනි. අද යුරෝපා ජාතීන් මෙම කැඩීබිඳී යාමේ උරුමක්කාරයෝය.

දැන්, ප්‍රතික්ෂේප කළ නොහැකි දෙය නම්, ක්‍රි.පූ. 600 යේ දානියෙල්ගේ දවසේ සිට වර්තමානය දක්වා වසර 2500 කට අධිකව, මැදපෙරදිග භූමින්, මධ්‍යධරණී ප්‍රදේශ සහ යුරෝපා ඉතිහාසය නියමිතවම දානියෙල් අනාවැකි කී මාර්ගයම අනුසරණය කිරීමයි. සියවස් ගණනක් අනාගතයට ඇති ඉතිහාසයේ ගමන් මඟ ඔහු දැනගත්තේ කෙසේද? නමුත් කවුරුන් හෝ දැන සිටියහ. දානියෙල් පැවසුවේ ස්වර්ගයේ දෙවියන්වහන්සේ එය ඔහුට එළිදරව් කල වගයි. අර්ථ දැක්විය හැකි එකම පැහැදිලි කිරීම එයයි.

නමුත් එය එසේ නම්, රජතුමාගේ සිහින විවරණයේ අවසානය ගැන අපි සැලකිලිමත් වියයුතු වෙමු. එය කලින් දුටුයේ පිළිරුවේ විනාශය සහ අවසානයේ අලුත් අධිරාජ්‍යයක ස්ථාපිතයක්ය.

> **"ඒ රජුන්ගේ දවස්වලදී ස්වර්ගයේ දෙවියන්වහන්සේ කිසිකලෙක නැති නොවන්නාවූ රාජ්‍යයක් පිහිටුවන සේක....... එය ඒ සියලු රාජ්‍යවල් පොඩි කර නැති කරන්නේය. එය සදාකාලේටම පවතින්නේය." (දානියෙල් 2:44-45)**

ලෝකයේ පැවතුනු අධිරාජ්‍යයන් ගැන දානියෙල්ගේ අනාවැකි වල සත්‍යතාවය දැකීමෙන් මෙම අවසන් වර්ධනය කෙරෙහි අප කල්පනාකාරී විය යුත්තේ, ඊළඟ මහත් අධිරාජ්‍යය දෙවියන්වහන්සේගේ රාජ්‍යය නිසාය. නමුත් එය ගැන පසුව විස්තර කරනු ඇත.

## ශිෂ්ටාචාරයේ ප්‍රගමනය

පසුගිය වසර 300 පුරාම, ලෝකය තුළ මිනිස් ජිවිතයේ ගුණාත්මක භාවය වැඩිදියුණුවේ යැයි දාර්ශනිකයෝ විශ්වාසයෙන් බලාපොරොත්තු වූහ. ජීව විද්‍යාත්මක පරිනාමයේ සිද්ධාන්තය, සමාජයීය සහ ආගමික පරිනාමීය සිද්ධාන්ත සමඟ කැටුව ආහ. මහත් බලාපොරොත්තුව වූයේ "වර්ධනයේ පෙරට යෑමය." 19 වන සියවස මහත් සර්වසුභවාදී යුගය විය. විද්‍යාත්මක

දැනුම වැඩිමේ ප්‍රතිපලය වූ කාර්මික තාක්‍ෂණයේ දියුණුව, භාණ්ඩ නිශ්පාදනයේ අතිමහත් ප්‍රවර්ධනයන් සමාජයේ යම් කොටස් සඳහා මහත් සම්පත් කරා මෙහෙය විය. පාර්ලිමේන්තු පනත්, සෞඛ්‍යය සහ නිවාස පාලනය කරමින් සමාජීය ප්‍රමිති වර්ධනය කිරීමට ඉලක්ක කරගත්හ. අධ්‍යාපනය ක්‍රමයෙන් සියල්ල සඳහා දිගුකරන ලදුව සමාජයේ වැඩි දියුණුවූ සදාචාරාත්මක විලාසයක් විශ්වාසවන්තව බලාපොරොත්තු වෙන ලදී. මිනිසුන් පොහොසත් වන විට, අපරාධ අඩුවනු ඇත. ඔවුන් වඩා යහපත්ව අධ්‍යාපනය ලද විට, ඔවුන් සාහිත්‍යය සහ කලාව අගය කරනු ඇත. ආදර්ශපාඨය වූයේ සංවර්ධනයයි. මිනිස් වර්ගයා අලුත් යුගයක් කරා පානගමින් සිටියහ.

20 වැනි සියවස සාධනය කලේ කෙතරම් අසහනකාරී කම්පනයක්ද ! ලෝක යුද්ධ දෙකක් නිපදවා ඇත්තේ විනාශවූ හෝ මිනිසුන් මිලියන ගණනක්, ගිණිය නොහැකි මිනිස් විඳවීම් සහ දේපල විනාශයන්ය. එවන් අතිශය විනාශයක් නැවත ඇතිවීම වැලැක්වීමේ උත්සාහයන් ව්‍යර්ථ වී තිබේ. 1920 ගණන් වලදී මුසොලිනිගේ සහ 1930 ගණන් වල හිට්ලර්ගේ නැගිමත් සමඟ ජාතීන්ගේ සංගමය ඇද වුටුනු අතර, එක්සත් ජාතීන්ගේ සංගමය ලෝකයේ බැරෑරුම් ගැටුම් වැලැක්වීමේ බලවිරහිත භාවය විදාමාන කරයි. න්‍යෂ්ටික ආයුධ වර්ධනය මුලු මිනිස් සංහතියේම පැවැත්මට භයානක තර්ජනයක් එල්ල කරන අතර සියලු මහා ජාතීන් තුළ විරැකියාව සමඟ ජාතීන්ගේ ආර්ථිකය අර්බුදයට හෙලා ඇත.

නමුත් සදාචාරාත්මක ගරා වැටීම වැඩියෙන් සැලකිය යුතුය. අසංක්ලිෂ්ට ජාතීන් දහම දෙසට තම පිටුපස හරවා ඇතත් එහි ස්ථානය ගැනීමට සුදුසු යමක් සොයාගෙන නොමැත. දික්කසාද ප්‍රතිශතය වැඩිවන අතර අපරාධ ප්‍රතිශතයද වැඩිවේ. අලුත් ලෙඩරෝග, විශේෂයෙන් ඒඩ්ස්, ලෝකයේ සමහර කොටස් ආක්‍රමණය කර ඇති අතර, පැතිරෙමින්ද පවතී. නියඟය හෝ භූමියේ වැරදි කලමණාකරනයේ කොටසක් ලෙස ඇතිවන සාගතය ජීවිත මිලියන ගණනකට තර්ජනය කලද, එය සිවිල් යුද්ධවලද ප්‍රතිපලයකි. කුඩා ජාතීන් තම අයිතිවාසිකම් අවධාරණය කර ඒවා රැකගැනීම සඳහා ආයුධ ගැනීමටද සූදානම්ය. කෙටියෙන් පවසනහොත්, ජාතීන් තම සදාචාරාත්මක , දේශපාලනික සහ ආර්ථික පදනම් පසුගිය යුගයන්හි නොසිතූ පරිදි කම්පනයට පත්කර ඇත.

මේ සියල්ල සිදුවන්නේ අප දියුණු යැයි කියාගන්නා 21 වැනි සියවසේ අතර එය ලෝක ව්‍යාප්තය. වර්ධනයේ සිහිනය වාෂ්පවී ගොස් ඇති අතර එහි ස්ථානය ගැනීමට කිසිවක් හමුවී නොමැත.

## මනුෂ්‍ය වර්ගයා දෙස බයිබලයේ දැක්ම

අපූර්ව කරුණ නම් මිනිස් වර්ධනයේ මෙම සර්ව ශුභවාදී දැක්ම බයිබලය බෙදා නොගැනීමයි. මිනිස් ශිෂ්ටාචාරයේ වර්ධනය පරිනාමීය නොව, නමුත් බලවත් විපත්තියක් බැව් බයිබලයේ දැක්ම ලෙස පවසා තිබේ. එනම්, මිනිසාගේ ප්‍රගමනය මහත් අර්බුදයකින් සහ තීරණාත්මක වෙනසකින් අවසන් වන බවයි. (යේසුස් නූතනකරණයේ අන්තරාය - එච්.ජේ. කැඩ්බරි 1934)

පරණි සහ නව ගිවිසුම් තුළ මෙය සඳහා සාක්ෂි පැහැදිලිය. “අන්තිමයේ දවස්” ගැන කථාකල දානියෙල් පෙරදුටුවේ “පෙර නොවූ ආකාර විපත්ති කාලයක්” තුළ “පොළොවෙහි ධූලියෙහි සැතපෙන්නන්ගෙන් බොහෝ දෙනෙක්, සමහරෙක් සදාකාල ජීවනයට....... පිබිද එන” බවය. (12:1, 2) අපෝස්තුලුවර පාවුල් “අන්තිම දවස්වලදී අන්තරා සහිත කාලයක් පැමිණෙන බැව්” පෙරදිටිය. ප්‍රචණ්ඩ සහ අසංවර පරම්පරාවක මතුවීම විස්තර කරන ඔහු මෙසේ පවසයි. “මුදලට ප්‍රේම කරන්නෝව, පාරට්ටු කරන්නෝව...... මවුපියන්ට අකීකරුවන්නෝව......... ජන්ම ස්නේහය නැත්තෝව...... මැඩපවත්වා නොගත්තෝව...... දෙවියන්වහන්සේට වඩා සැප සෙල්ලමට ප්‍රේමකරන්නෝව, දේවභක්තියේ වේසය දරන නමුත් එහි බලය එපාකල අයව සිටින්නෝය.” (2 තිමෝති 3:1-5) අපගේ යුගයේ භෞතිකවාදී, අදේවවාදී සහ නොහික්මුණු ගුණයයන්ගේ සමානත්වයට කැපී පෙනෙයි. යේසුස්වහන්සේම මෙසේ නිශ්චිත වූහ. යෙරුසලම තවදුරටත් ජාතීන්ගේ අධිපත්‍යයට යටත් නොවූ කලෙක, “........වියවුලෙන් පොළොවේ ජාතීන්ට දුක් වේදනා වන්නේය....... ලෝකයට පැමිණෙන්නාවූ දේ බලාපොරොත්තුව සිටීමෙනුත් මනුෂ්‍යයන්ගේ සිත් ක්ලාන්ත වන්නේය.” (ලූක් 21:25,26)

නමුත් මෙම අනාවැකි හමුවන ලේඛන වසර 2000ක් හෝ ඊටත් වැඩියෙන් පැරණිය. වසර 100 ක් තරම් අතීතයේ සිටි ඥාණවන්ත මිනිසුන් අනාවැකි පවසන පරිදි, මිනිස් වර්ගයාගේ ප්‍රගමනයේ කූටප්‍රාප්තිය සාමය සහ සෞභාග්‍යය සපිරිනු තත්ත්වයක් නොවන බැව් මෙම ලේඛකයන් දැනගත්තේ කෙසේද? නමුත්, මිනිසුන් වශයෙන්, ඔවුනට දැන සිටීමට නොහැකිවනු ඇත. නමුත්, යම්කිසිවෙක් දැනසිටි බැව් පැහැදිලිය. ඔවුන් ලේඛනගත කල දැයට අනුභාවය දීමට, මිනිස් මනසට වඩා ශ්‍රේෂ්ඨ මනසක් තිබිය යුතුය. එය සහතිකව දෙවියන්වහන්සේගේම විය. අන් කිසිම තේරුම්කර දීමක් කරුණු සමඟ එකඟ නොවේ.

## කූටප්‍රාප්තිය

සියලූ ජාතීන් සඳහා එක් ලෝක ආණ්ඩුවක අවශ්‍යතාවය දර්ශණය වූයේ පසුගිය අඩසියවස තුළදී පමණය. දෙවැනි ලෝක යුද්ධයෙන් කෙටි කලෙකට පසුව, ගුවන් විදුලි කථා මාලාවක බර්ට්‍රන්ඩ් රසල් අවධාරණය කර සිටියේ, වසර 50 ක් ඇතුලත තම තීරණ ක්‍රියාත්මක කිරීමේ බලය ඇති එක් ලෝක අධිකාරියක් ලෝක ජාතීන් සංවර්ධනය කරගත යුතු බවයි. මෙය මුදුන්පත් නොකලහොත්, ශිෂ්ටාචාරය විනාශ වන බැව් ඔහු පැවසීය. එක්සත් ජාතීන්ගේ සංවිධානය ස්ථාපිත කිරීම තුළින් මෙය ක්‍රියාත්මක කිරීම සඳහා අවංක උත්සාහයක් ගෙන ඇත. සුළු විරුද්ධවාදීකම් කිහිපයක් විසඳීමට එයට හැකි වී ඇතත් මහා ජාතීන්ගේ ආරවුල් සහගත අයිතිවාසිකම් එය අප්‍රාණික කර ඇත. මුලු පෘථිවියටම එක් ආණ්ඩුවක අවශ්‍යතාවය යන සංකල්පය බොහෝ නූතන වර්ධනයක් බවත්, තම අභිලාශයන් කෙසේ හෝ ඉටුකර ගැනීමට තීරණය කරගත් ප්‍රචණ්ඩ සුළුතරයන් පාලනය කිරීමට නොහැකි, නමුත් මාරාන්තික ආයුධවලින් සමන්විත තරඟකාරී බලවතුන්ගේ පැවැත්ම නිසා රැගෙන ආ එකක් බවත් නැවත අවධාරනය කිරීම වටිනේය.

අපූර්ව කරුණ නම්, මිනිස් ඉතිහාසයේ කූටප්‍රාප්තිය සහ ලෝක සාමය සඳහා අත්‍යාවශ්‍යයේ පදනම ලෙස මුලු ලෝකයටම එක් ආණ්ඩුවක් ස්ථාපිත කිරීම ආරම්භයේ සිටම බයිබල් ලේඛකයන් අනාවැකි පළකර සිටීමයි. අපි දැනටමත් එහි පැහැදිලි සාක්ෂි දුටුවෙමු. ලෝක අධිරාජ්‍යයන් මාලාව ගැන ඔහුගේ අනාවැකියේ දානියෙල් දුටුවේ, ඔවුන්ගේ අවසන් විනාශය සහ අලුත් අධිකාරියක් යටතේ පිහිටු වන්නාවූ නව ලෝක පිළිවෙලක්‍ය. (මේ ගැන වැඩි විස්තර සඳහා බයිබල් පුරෝකථන පොත් පිංච සඳහා අයදුම් කරන්න.)

> **"ඒ රජුන්ගේ දවස් වලදී ස්වර්ගයේ දෙවියන්වහන්සේ කිසිකලෙස නැති නොවන්නාවූ රාජ්‍යයක් පිහිටුවන සේක...... එය සදාකාලේටම පවතින්නේය." (දානියෙල් 2:44)**

## එක් ලෝක පාලකයෙක්

මේ ක්‍රිස්තුස්වහන්සේගෙන් වසර 600 ක් එපිටදීය. ඉන් සියවසකට හෝ එවැන්නකට පෙර, යෙරුසලෙමේ ලෝක අධිකාරියක් පිහිටුවන බවත්, දිව්‍යමය ව්‍යවස්ථාව ලබාගැනීම සඳහා සියළු ජාතීන් එහි යන බවත් යෙසායා අනාවැකි පළකලේය. ප්‍රතිපලය වනුයේ ලෝකයේ ජාතීන් අතර සාමයයි. "ජාතියක් ජාතියකට විරුද්ධව කඩුව ඔසවන්නේවත් තවත් යුද්ධ ඉගෙන ගන්නේවත් නැත." (යෙසායා 2:2-4) අලුත් ගිවිසුමේ මහත් තේමා වලින් එකක්

නම් ගැටළු සහ ව්‍යසන පිරි අවස්ථාවකදී යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නැවත පෘථිවියට පැමිණ පෘථිවිය පුරාම දෙවියන්වහන්සේගේ අධිකාරි ස්ථාපිත කරන බවය.

නූතන ලෝකයේ අසමගි ජාතීන් හට ඉතා දැඩි ලෙස අවශ්‍ය කරන්නාවූ නිශ්චිතය නම් මුලු පෘථිවයටම ක්‍රිස්තුස්වහන්සේගේ පාලනය යටතේ ස්ථාපිත කරන්නාවූ මෙම එක් ආණ්ඩුවයි. එය සැදැහැවත් පොරොන්දු පිරි ආණ්ඩුවක් නොවන අතර ජාතීන්ගේ ගැටුම්කාරී අයිතීන් පාලනය කිරීමට බලය ඇත්තාවූ එකකි. එහි බලය පමණක් නොව, සියල්ලගේ යහපත සඳහා නිවැරදි ප්‍රතිපත්තියද තිබෙනු ඇත. පාලකයාම විශේෂයෙන් පුහුණු කර සහ තෝරාගෙන ඇත. මුලු පෘථිවියම පාලනය කිරීමට යම් කෙනෙක් අපට තෝරාගන්නට හැකිනම්, මිනිස් ඉතිහාසයේ ශ්‍රේෂ්ඨතම පුද්ගලයා, දෙවියන් වහන්සේගේ පුත්‍රයා වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ හැර වෙන කවුරන්ද? උන්වහන්සේගේ සදාචාරාත්මක ධෛර්යය, සත්‍යයට කැපවීම, අන්‍යයන් සඳහා දයාවන්ත සැලකිල්ල, කුහකත්වය හෙලා දැකීම සහ සියල්ලට ඉහලින් දෙවියන්වහන්සේට වන්දනා කිරීමේ තම පූර්ණ කැපවීම මිනිස් ලෝකයේ අද්විතිය මේ අතිවිශිෂ්ට ගුණයන් සියල්ල සමගින්, වඩා ප්‍රබුද්ධ මිනිසුන් විසින් ආශාකරනු ලැබූ නමුත් නිතරම ඔවුන්ගේ ග්‍රහණය ඔබ්බේ තිබූ නව ලෝක පිළිවෙලේ පරමාදර්ශී පාලකයා උන්වහන්සේ වෙනු ඇත.

## සදාකාලයටම රජ කෙනෙක්

නමුත් තවත් එක් සැලකිය යුතු කරුණක් ඇත. සමහර අවස්ථාවන්හිදී මිනිස් පාලකයන් යහපත් වී තම ජනතාව සඳහා වාසි ස්වල්පයක් සම්පූර්ණ කරනු ඇත. නමුත් අවසානයේදී ඔවුන් මියයන අතර ඔවුන්ගේ අනුප්‍රාප්තිකයන් ආකර්ෂණීය වනු ඇතැයි යන සහතිකය කුමක්ද? ක්‍රිස්තුස්වහන්සේගේ කාරණය අරබයා මෙම දැඩි අපහසුතාවය පැන නොනගින්නේ උන්වහන්සේට සදාකාල ජීවිතය ඇති නිසාත් උන්වහන්සේගේ ආණ්ඩුව සියලු කාලයටම පවතින නිසාත්ය.

සියවස් බොහෝ ගණනකට පෙර බයිබලයේ සටහන්වූ, පෘථිවියේ සියලු ජාතීන් හට සාමය සහ ආශිර්වාද සහතික කල ලෝක ආණ්ඩුවක සැලැස්මක් 21 වැනි සියවසේ ජාතීන්හට නිශ්චිතවම අවශ්‍ය වන්නේ කෙසේද? අනෙක් කිසිම ආගමක හෝ මිනිස් සාහිත්‍යයක හෝ මෙවන් පැහැදිලි ප්‍රකාශයක් නොකෙරුනද, මෙහිලා බයිබලය අද්විතිය වන්නේ ඇයි? නැවතත්, පැමිණෙන්නාවූ දෙය ලෝකයට අවශ්‍ය වන්නේ යැයි කවුරුන්හෝ දැන සිටින්නට ඇත. මෙය විස්තර කරදීමට සියල්ල දකින්නාවූ මනසක් අවශ්‍යය.

එය දෙවියන්වහන්සේ විය යුතුය. වෙනත් කිසිම පැහැදිළි කර දීමක් අර්ථ විරහිතය.

## සදාචාරාත්මක සාධකය

ක්‍රිස්තුස්වහන්සේට පෙරවූ මිත්‍යාදෘෂ්ඨික සියවස් තුළ මිනිසුන් හිරු, සඳු සහ තාරකා වැනි ස්වභාවික ප්‍රපංච සහ ඇතැම් විට සතුන් පවා වන්දනාමාන කලහ. තමන්ගේ දරුවන් ගින්නෙහි පූජා කිරීම දෙවියන් අපේක්ෂා කරන්නේ යැයි ද අභික්ෂිත වතාවන් තුළ සිතනු ලැබීන. මොලෙක් වන්දනා කිරීම ගැන පැරණි ගිවිසුම් ඉඟි සහ මීකාගේ ප්‍රශ්නය වූ "මාගේ ආත්මයේ පාපය නිසා මාගේ ශරීරයේ පලයන් දෙම්ද?" (6:7) උදාහරණයෝය. ග්‍රීසියේ සහ රෝමයේ ප්‍රවාදමය දෙවිවරු කීර්තිමත් මිනිසුන්සේ පෙනෙන අතර බොහෝ විට මිනිස් දුසිරිත් ද ප්‍රදර්ශනය කරති. රෝමානු ලෝකය තුළ ශුධවාදී ස්වභාවයෙන් යුත් පෙරදිග ලබ්ධි, බොහෝ විට ශුද්ධවූ ගණිකා වෘත්තිය හා සම්බන්ධ අනාචාරී වතාවන් සමඟ මුසුව්, ප්‍රවාදමය දෙවිවරුන්ගේ ඇදහිලි පිරිහී ගිය පසු බලවත් කමින් වැඩුනි. නූතන පෙරදිග ආගම්වල දෙවිවරු දුරස්ථසේ පෙනෙන අතර සාමාන්‍ය ජනතාවගේ එදිනෙදා අත්දැකීම් කෙරෙන් බොහෝ සේ ඉවත් වූ දාර්ශනික පූර්ණතාවයේ සෞන්‍ද්‍රයක් අරක්ගෙන ඇති බැව් පෙනෙයි.

නමුත් බයිබලය තුළ දෙවියන්වහන්සේ විචිත්‍රවත් කරන්නේ සම්පූර්ණයෙන්ම වෙනස් දැක්මක් වන අතර එය ලෝකය තුල අද්විතියය. දෙවියන්වහන්සේට උත්තරීතර බලය සහ අධිකාරිය ඇත. මක්නිසාද උන්වහන්සේ ස්වර්ගය සහ පෘථිවියද, මිනිස් වර්ගයාගේද මැවුම්කරුවාණෝය. නමුත් සියල්ලටම ඉහලින්, උන්වහන්සේ නිශ්චිත සදාචාරාත්මක ගුණයන් සතු සහ මිනිස් වර්ගයා සමඟ කටයුතු වලදී ඒවා පවත්වාගෙන යන්නාවූ දෙවි කෙනෙකි. මෝසෙස් මගින් ඉශ්‍රායෙල් හට දුන්නාවූ උන්වහන්සේගේම විස්තරය පිටපත් කිරීම හැර වෙන දෙයක් කිරීමට අපට නොහැක.

> **"ස්වාමීන්වහන්සේ........ අනුකම්පාවෙන් පූර්ණ වූ දායාවන්තවූ උදහස් වීමට ප්‍රමාදවන්නාවූ අධිකතර කරුණාව සහ සැබෑකමද ඇත්තාවූ දෙවිකෙනෙක්ය........ අයුතුකමත් අපරාධයත් පාපයත් ක්ෂමා කරන සේක. වරදකරුවන් කවර ප්‍රකාරයකින්වත් නිදහස් නොකරණ සේක......" (නික්මයාම 34:6-7)**

ශුද්ධවූභාවයේ සහ සත්‍යයේත්, තමන්වහන්සේට සේවය කිරීම සොයන්නන්ගේ දුබලකම් සිහිකරන, තමන්වහන්සේ ඉදිරියේ යටහත්

වන්නාවුන් හට ක්‍ෂමාව දිගු කරමින් සිටිනා දෙවියන්වහන්සේගේ මෙම ප්‍රතිරූපය, වසර 1000 ක් තුළ පැරණි ගිවිසුමේ නොවෙනස්ව පවත්වාගෙන යන අතර ක්‍රි.ව. 1 වැනි සියවස තුළ නව ගිවිසුමේ නැවත දර්ශනය වේ. ලෝකයේ කොයිම සාහිත්‍යයකවත් මෙසේ වී නොමැත.

දෙවියන්වහන්සේගේ පුත්‍රයා වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ දර්ශණයෙන් එය නව ගිවිසුම තුළ ප්‍රතිසාධනය කර ඇත. පියාණන්ගේ උත්කෘෂ්ඨභාවය අවලව හඳුනා ගනිමින් උන්වහන්සේ තම පියාණන්ගේ සදාචාරාත්මක ගුණාංගයන් පිළිබිඹු කලහ. උන්වහන්සේ තුළ සියලු සත්‍යයට කැපවීම, නොබියව දුෂ්ඨභාවයේ යථාරූපය නිරාවරණය කිරීම, මිනිස් දුබලතාවය කෙරෙහි දැක්වූ කරුණාව සහ තම කැමැත්ත පසෙක තබා දෙවියන්වහන්සේට සේවය කිරීමේ කැපවීම - මේ සියල්ලත් තවත්, මිනිස් අත් දැකීම් තුළ අද්විතියය. බයිබලය තුළ මිස, මෙවන් චිත්‍රයක් ලොව කිසිම තැනකින් සොයාගත නොහැක.

ප්‍රශ්නය නම්, මෙය පැමිණියේ කොතනින්ද? අතීතයේ සාක්‍ෂි තුළින් විනිශ්චය කරන්නේ නම්, කිසිම මිනිසෙකු හෝ කිසිම මිනිස් අධිකාරියක් හෝ මෙම දැක්ම ගැන සිතන්නේවත් නැත. බොහෝ සියවස් ගණනාවක කාල පරාසයක් තුළ එය පවත්වාගෙන යන්නටත් නොහැකිය. බලවත් හැගීම නම්, බයිබලය තුළ හමුවන දෙවියන්වහන්සේගේ චිත්‍රය තෝරා දීමට අපට දෙවියන්වහන්සේම අවශ්‍ය බවය.

## ලෝකය තුළ දෙවියන්වහන්සේ

නමුත් තවත් එක් දෙයක් ඇත. බයිබලයේ දෙවියන්වහන්සේ මනුෂ්‍ය වර්ගයාගෙන් දුරස්ථ නොවූ මිනිසුන් සහ ගැහැණුන්ගේ එදිනෙදා අත්දැකීම් කෙරෙන් බොහෝ සේ ඉවත් වූ දාර්ශනික පූර්ණත්වයේ ක්‍ෂෙත්‍රයක් අරක්ගෙන නොසිටින අතර, මිනිස් ඉතිහාසය සමඟ සජීවීව සම්බන්ධය. මනුෂ්‍ය වර්ගයා මැවීමෙන් අනතුරුව තම කැමැත්ත විශ්වනීය ප්‍රතික්ෂේප කිරීමකට ලක්ව, තමන්ගේම ජනතාවක් මවා, ආබ්‍රහම් සහ ඔහුගේ අනුප්‍රාප්තිකයන් හට පොරොන්දු දී, ඔවුන් තමන්ගේම භූමියකට රැගෙනවිත්, එහිදී ඔවුන් ආගමික සහ සාමාජයීය ජීවිතයකට විශේෂයෙන් හුරුපුරුදු කර, "තමන්වහන්සේගේ නමට ජනතාවක්" සැදිය. වසර 1000 කට අධිකව උන්වහන්සේ ඔවුන් රැකගත් අතර ඔවුන්ගේ දුෂ්ඨ මාර්ගවල ප්‍රතිවිපාක වලට එරෙහි අවවාද කිරීමට නිතරම දැවැස්වරු එවා, විශ්වාසවන්ත ස්වල්ප දෙනෙකු හට පොරොන්දු දෙන ලදී. අන්තිමේදී ඔවුන්ගේ හිතුවක්කාරී කැරැල්ල නිසා තම භූමියෙන් පිටමං කල විට, උන්වහ්නසේ ස්ත්‍රියක මගින් උපත ලද පුත්‍රයෙකු තුළින් තමන්වහන්සේ

විද්‍යමාන කලසේක. පුද්ගලික මිනිසුන් සහ ගැහැණුන් පාපය සහ මරණය කෙරෙන් මිදීම දෙවියන්වහන්සේ ඔහු තුළින් ස්ථාපිත කල අතර එම සුභාරංචිය ලෝකය පුරා විසුරුවන්නට ක්‍රියා කල සේක. ඉන්පසු කූටප්‍රාප්තිය ලෙස, ජාතීන්ගේ නැගීම සහ බැසීම පාලනය කොට, මිනිස් වර්ගයාගේ සුභසාධනය සහතික කිරීමට මුළු පෘථිවිය පුරා තමන්ගේම ආණ්ඩුව පිහිටුවීමට උන්වහන්සේ පොරොන්දු වී ඇත. මෙය කෙටියෙන්, මිනිස් ජීවිත තුළ සම්පූර්ණයෙන්ම සම්බන්ද, සැබෑ ඓතිහාසික ඉසව් වලට බලපෑම් කරන සහ මුලු පෘථිවියම උන්වහන්සේගේ නාමයට ගෞරව දක්වන සැලසුම් අවසානයක් කරා මනුෂ්‍ය වර්ගයාගේ ප්‍රගමනය රැගෙන යන්නාවූ දෙවියන්වහන්සේගේ චිත්‍රයක් වන්නේය.

දැන්, ලෝකයේ කිසිම ආගමක එවන් දෙවිකෙනෙක් නොමැති අතර, කිසිම යුගයක හෝ රටක මිනිස් ලේඛනයක එවැනි සංකල්පයක් හමුවන්නේද නැත. එය බයිබලයට අද්විතීයය. විස්තර කරන ලද දිව්‍යමය ක්‍රියාකාරකම් කිසිම ස්ථානයක් සමඟ සමාන්තර නොවේ. නමුත් මෙම දෘෂ්ඨිය පරිකල්පනය කලේ කවුරුන්ද? වසර 1500 ක් පුරා එය නිරන්තරයෙන් පවත්වාගෙන ගියේ කෙසේද? එම දෙවියන්වහන්සේම, එම සදාචාරාත්මක ගුණයන්ම, එම ප්‍රායෝගික අභිලාෂයන්ම ක්‍රි.පූ. 1400 මෝසෙස් සිට ක්‍රි.ව. 1 වැනි සියවසේ සිටි අපෝස්තුලුවර යොහන් දක්වා ? කිසිම මිනිස් මනසක් හෝ මනස් සමූහයකට මෙය ඉටුකර ගැනීමට නොහැකිවනු ඇත. උත්කෘෂ්ඨ මනසක් ඒ සියල්ල අධීක්ෂණය කරන්නට ඇත. බයිබලය උන්වහන්සේ චිත්‍රනය කරන පරිදි ස්වර්ගයේ දෙවියන්වහන්සේගේ පැවැත්ම, මෙම කරුණු මගින් ධනාත්මකව ඉල්ලා සටී, උන්වහන්සේගේ කැමැත්ත සහ අභිප්‍රායේ ප්‍රකාශනය බයිබලයයි.

## "මෙම මනුෂ්‍යයා හට........"

ලෝකයේ සියලු ජාතීන්හට සහ මනුෂ්‍ය වර්ගයාගේ අනාගත අභිවෘද්ධිය සඳහා බයිබලය දෙවියන්වහන්සේගේ සැලැස්ම එළිදරව් කරන ආකාරය අපි දුටුවෙමු. නිරීක්ෂණය කිරීමට කැමති සෑම පුද්ගල මිනිසෙකු සහ ගැහැණියක් සඳහාම බයිබලය තුළ පණිවිඩයක් ඇතැයි යන අපූර්ව කරුණ දැන් අපි සලකා බලමු.

උන්වහන්සේට "බයවන්නාවූ", එනම් ගෞරව කරන්නාවූ මිනිසුන් සහ ගැහැණුන් සඳහා උන්වහන්සේගේ විශේෂිත ආරක්ෂාව දෙවියන්වහන්සේගේ වචනය අචලව සහතික කල බැව් ඉශ්‍රායෙල් ඉතිහාසයේ කැලඹුනු සියවස් පෙන්වති. ස්වර්ගයේ සහ පෘථිවියේ මහත් මැවුම්කරුවාණන් තමන්වහන්සේ බැව් ඉශ්‍රායෙලයට සිහිගන්වන ආකර්ෂණීය නිදර්ශනයක් යෙසායා තුළ සොයාගත හැක. උන්වහන්සේ තවදුරටත් පවසමින්:

"යටහත්වූ, තැළුණු ආත්මයක් ඇත්තාවූ, මාගේ වචනයට වෙව්ලන්නාවූ මනුෂ්‍යයා දෙස බලමි." (යෙසායා 66:1 - 2)

මෙම පණිවිඩය දෙනු ලද්දේ ඉශ්‍රායෙල් ජාතිය මහත් ගැටළු වලට මුහුණපා සිටි අවස්ථාවකය. ඔවුන්ගේ උතුරු රාජධානිය, යුදා දේශය ආක්‍රමණය කල ඇසිරියානුන් විසින් විනාශ කර තිබුනි. ධනවත් සහ බලවත් අය විසින් දුබලයන් පීඩාවට පත්කර, දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව ජාතිය විසින් අත්හැරීම හේතුකොට පිළිම වන්දනාව වැඩිවී අසංවරභාවය වර්ධනය වී සමාජය දූෂිතව තිබුනි. නමුත් මෙම ජාතික අර්බුදකාරී අවස්ථාවේදී, යටහත් වීමට හදවත් ඇති, තම පාපය කියාදෙන සහ දෙවියන්වහන්සේගේ වචනයට ගෞරවයෙන් ඇහුම්කන් දෙන සැම පුද්ගලික මිනිසෙකු සඳහාම දෙවියන් වහන්සේ පණිවිඩයක් දුන්සේක.

දැන් යේසුස්වහන්සේ කරන්නේද මෙයයි. මිනිසා සඳහා දෙවියන් වහන්සේගේ අභිප්‍රාය, උත්තානය සහ විනිශ්චය සම්බන්ධව යග කූටප්‍රාප්තිය වශයෙන් සියලූ ජාතීන්ගේ රාජ්‍යය ගැන උන්වහන්සේ සැලකිලිමත් වූවත්, පුද්ගලයාගේ අවශ්‍යතා ගැනද උන්වහන්සේ සවිඥාණකය.

> "වෙහෙසවෙන්නාවූ බරඋසුලන්නාවූ සියල්ලෙනි, මා වෙතට වරෙල්ලා, මම නුඹලාට සහනය දෙමි. මම සිතින් මෘදුව යටත්ව සිටින බැවින්, මාගේ වියගහ නුඹලා පිටට ගෙන, මාගෙන් ඉගෙන ගනිල්ලා. එවිට නුඹලාගේ ආත්ම වලට සහනය ලැබෙන්නේය." (මතෙව් 11:23-30)

සැම පුද්ගල මිනිසෙකු සහ ගැහැණියකටම බලාපොරොත්තුවේ සහ ධෛර්යයේ මෙම පණිවිඩය නව ගිවිසුමේ සැම පිටුවකම ප්‍රතිසාධනය කර ඇත.

මෙය කෙතරම් විස්මිත සංකල්පයක්ද : ජාතීන්ගේ සහ රාජ්‍යයන්ගේ පාලකයාවූ ස්වර්ගයේ දෙවියන්වහන්සේ හට, තම නාමයට ගෞරව කරන සහ තම අභිලාෂය ඉටුකරන පුද්ගලයා දෙසද අනුග්‍රාහිකව බැලිය හැක. දෙවියන් වහන්සේ ගැන සංකල්පයක් ලෙස එය ලෝකයේ අද්විතීයය. බයිබලයම පමණක් එය එළිදරව් කරයි.

## අවසානය

අපගේ නිගමනයන් සංක්ෂිප්ත විය හැකිය. බයිබලය ලෝකයේ අද්විතීය පොතකි. එය මිනිසා විසින්ම ලිවීමට නොහැකි වූවෙකි. එය දෙවියන්වහන්සේගේ වචනයක් විය යුතුය.

එම නිසා එය සජීව්ව වැදගත්ය. ගෞරවනීය අවධානයෙන් සහ දැඩි

ඕනෑකමින් එය කියැවිය යුතුය. එය අපගේ සියලු ගැටළු වලට පිළිතුරු ලබාදෙන අතර, අප හිරිහැරයට පත් කරන අනතුරු ගැන අවවාද කරමින්, දෙවියන්වහන්සේගේ රාජ්‍යය තුළ අලුත් ජිවිතයේ සහ වර්තමානයේ උපකාරයන් ගැන බලාපොරොත්තුව ගෙනදෙයි. ලෝකයේ කිසිම පොතකට මෙය කල නොහැක. එය නොසලකා හැරීම, උදාසීනව සැලකීම අනුවන ක්‍රියාවක් වනු ඇත. අපි නැණවත් වී , අඳුරින් සහ සැකයෙන් පිරුණු ලොවක ජිවිතයේදී, මෙම වචනය ශ්‍රවණය කරමු.

- ෆ්‍රෙඩ් පියර්ස් -

# <u>ප්‍රශ්න</u>

1. ලෝකයේ ආගම් සතු අනෙකුත් සියලු ග්‍රන්ථ සහ ලියැවිලි අතුරින් බයිබ... වෙනස් වන්නේ මන්ද ?

2. 2 තිමෝති 3:14 සිට 17 පද දක්වා සහ 2 පේතෘස් 1:20, 21 පද කියවන්න. මෙම ශුද්ධ ලියවිලි පවසන්නේ කුමක්දැයි ඔබ විශ්වාස කරන පරිදි ඔබගේ වචනයෙන් ලියන්න.

3. එය ලියැවී ඇති වසර 1500 පුරා, බයිබලයේ ප්‍රධාන පණිවිඩය සහ තේමාව කුමක්ද ?

4. බයිබලය දෙවියන්වහන්සේගේ වචනය ලෙස ප්‍රකාශ කරයි. මෙම ප්‍රකාශය තහවුරු කිරීමට එය යොදාගන්නා පද කාණ්ඩ කිපයක් මොනවාද ?

5. බයිබල් ග්‍රන්ථවල විවිධ ලේඛකයෝ තම ලියැවිලි දෙවියන්වහන්සේගේ වචනය ලෙස ප්‍රකාශ කලහ. ඔවුන්ගේ සමකාලීනයෝ එම ප්‍රකාශ පිළිගත්හ. ඒ ඇයි ? මෙහි ප්‍රතිපලයක් ලෙස අපට ලැබිය හැකි සහතිකය කුමක්ද ?

6. මිනිසා සහ ඔහුගේ චරිතය ගැන බයිබලය අපට පවසන්නේ කුමක්ද ? එහි නිරන්තර විසතර, එය මිනිසා විසින් නොව දෙවියන්වහන්සේ විසින් ලියන ලද බැව් සාධනය කරන්නේ ඇයි ?

7. යෙසායා 41:21 සිට 24 පදවල, ලෝකයේ ආගම් වල මිත්‍යා දෙවිවරුන් සහ පිළිම වලට එරෙහිව දෙවියන්වහන්සේ අභියෝග කරයි.

   (i) දෙවියන්වහන්සේ ප්‍රකාශ කරන අභියෝගය කුමක්ද ?

   (ii) තමන්වහන්සේ දෙවියන්වහන්සේ බැව් සාක්ෂි දැරීම සඳහා අකීකරු සහ එකඟනොවන්නාවූ ජනතාවක් උන්වහන්සේ යොදා ගනී. මෙම ජනතාව කවුද - ඔවුන්ගේ රටෙහි නම කුමක්ද? දෙවියන්වහන්සේ ඔවුනට සලකූ සැටිත් ඔවුන් ප්‍රතිචාර දැක්වූ සැටිත් විස්තර කරන්න.

8. දෙවියන්වහන්සේගේ පුරෝකථනය සම්පූර්ණ වීමෙන් 20 වැනි සියවසේ සිදුවූ සිද්ධිය කුමක්ද?

9. ලෝක ඉතිහාසයේ කූටප්‍රාප්තිය ලෙස බයිබලය අනාවැකි පවසන්නේ කුමක්ද? පෘථිවිය මත දෙවියන්වහන්සේගේ රාජ්‍යය රැගෙන ඒම සඳහා නැවත පැමිණෙන්නේ කවුද?

10. උන්වහන්සේ පොරොන්දුවූ ආශ්චර්යමත් අනාගතය උරුම කර ගැනීමට සහ දෙවියන්වහන්සේ හට ප්‍රසන්නවූ ජනතාවගේ ගති ලක්ෂණ කවරේද?